# ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
# ලංකා ධීවර සංස්ථාව
# පුරප්පාඩු

CEYFISH

ලංකා ධීවර සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සේවා ගණය : ජ්‍යෙෂ්ඨ කළමනාකාර**

**තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන සහ පරිපාලන)( HM 1-1& - 01)**

**බාහිර අපේක්ෂකයින්**
**සුදුසුකම්**

1.විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණය/මානව සම්පත් කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණය/මානව සම්පත් කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක /ආයතනයක/පිළිගත් වාණිජ ආයතනයක කළමනාකරණය/මානව සම්පත් කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය පිළිබඳව "කළමනාකරණ මට්ටමේ " අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන :** ක්ෂේත්‍රයට අදාල පොත් -පත් පළ කර තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අභ්‍යන්තර අපේක්ෂකයින් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.

2. කළමනාකාර සේවා ගණයෙහි (එම් එම් 1-1) තනතුරක, 1 ශ්‍රේණියේ මානව සම්පත් සංවර්ධන/පරිපාලන පිළිබඳව අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන :** ක්ෂේත්‍රයට අදාල පොත් -පත් පළ කර තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**වැටුප : HM 1-1 - 2025 Rs. (140,640-15 x 4,100 - 202,140)**

**රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා (ජීවන වියදම් දීමනාව හා චක්‍රලේඛ ප්‍රකාරව වෘත්තිය දීමනාව) හිමි වේ.**

**වෙනත් ප්‍රතිලාභ**

1) සේවක අර්ථසාධක අරමුදල් වෙනුවෙන් වැටුපෙන් අඩු කර ගන්නා 10% දායක මුදල සඳහා සංස්ථාව මගින් 15% දායක මුදලක් බැර කරනු ලැබේ.
2) සේවක භාරකාර අරමුදල, සඳහා සංස්ථාව 3% ක ප්‍රදානයක් බැර කරනු ලැබේ.
3) රජයේ චක්‍රලේඛ අනුව ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව හා දුරකථන දීමනාව හිමි වේ.

**පොදු කොන්දේසි**

(අ) අපේක්ෂිතයින්ගේ වයස අවු: 35 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
(ආ) රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාල ප්‍රධානින් මාර්ගයෙන් එවිය යුතුය.
(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ඈ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(ඉ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු වේ.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත තොරතුරු (CV) හා අදාල අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව **2026.10.12** දිනට හෝ ඊට ප්‍රථම තනතුරේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
(E mail : chairman@cfc.gov.lk )

සභාපති
ලංකා ධීවර සංස්ථාව
නො 15, රොක් හවුස් පටුමග
කොළඹ 15.
දුරකථන අංක 0112-540455

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED